# ශ්‍රී ලංකාවේ ජීවත්ව සිට ප්ලයිස්ටොසීන යුගයේ දී වඳවී ගිය අලි ඇතුන්

චාමර උදයංග *

මූලික වශයෙන්ම මෙම යුගයට අයත් වඳවී ගිය අලි ඇතුන්ගේ ෆොසිල හමුවන්නේ ප්ලයිස්ටොසීනයට අයත් (අදින් වසර 11700 සිට වසර මිලියන 2.58 දක්වා අතර කාලය) ෆොසිල තැන්පතු තුළිනි. අතීතයේදී වගුරු බිමක්ව පැවති රත්නපුර සත්ත්ව සන්නතිය (Rathnapura Fauna) ලෙස හඳුන්වන රත්නපුරය මූලික කරගත් සබරගමුව පළාතේ විවිධ ප්‍රදේශ (රූපසටහන 1) වල ඇති දියලු (Alluvial) තැන්පතුවල මෙම හස්තීන්ට අයත් ෆොසිල සුරක්ෂිත වී ඇත. මෙම ප්‍රදේශයේ මැණික් පතල් කරුවන් විසින් මැණික් ගැරීම සඳහා සිදුකරනු ලබන පතල් හෑරීමේ දී පොළව අභ්‍යන්තරය තුළ හමුවන දියලු තැන්පතු තුළ තිබී සහ එම ප්‍රදේශයේ ඇති ගංගා පතුල් තුළින් ද පොළව තුළ සිදු කරනු ලබන වෙනත් කැණීම් තුළින්ද මෙම හස්තීන්ට අයත් ෆොසිල විශාල වශයෙන් හමුවේ. දියලු තැන්පතුවල තිබී හමුවන මෙම අලි ඇතුන්ගේ පාෂාණීභූත වූ අස්ථි කොටස් සමඟ ප්ලයිස්ටොසීනයේ දී වඳවී ගිය සහ වර්තමානය දක්වාම ජීවත් වන ඇතැම් සත්ත්ව විශේෂ වලට අයත් සහ ප්‍රාග් ඓතිහාසික මානවයින්ගේ පාෂාණීභූත වූ අස්ථි කොටස් ද හමුවේ. එමෙන්ම ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ ගුහා සහ විවෘත්ත වාසස්ථාන තුළ සිදු කරනු ලබූ කැණීම් තුළින් ද මෙම පුරාණ හස්තීන්ට අයත් ෆොසිල හමු වී ඇත. බෙල්ලන්බැඳිපැලැස්ස (අදින් වසර 12750 ට පෙර) ප්‍රාග් ඓතිහාසික විවෘත්ත මානව වාසස්ථානයේ සිදු කරනු ලැබූ කැණීම්වලින්ද අලියෙකුගේ අස්ථි කොටසකින් සාදන ලද මෙවලමක් (Elephant bone tool) සොයාගෙන ඇත. මෙම ෆොසිල සාධකවලට අමතරව ප්ලයිස්ටොසීනයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයින් විසින් සහ ඔවුන්ට ලඟම ඥාතීත්වයක් දක්වන වැදි ජනතාවගේ මුතුන් මිත්තන් සිදුකරනු ලැබ ඇති මානව කෘතීන් Paintings and Engravings (ගුහා චිත්‍ර සහ ගල් වල කොටන ලද රූප) තුළින්ද ප්‍රාග් ඓතිහාසික යුගයේ දී මෙම අලි ඇතුන් ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව සිටි බවට කිව හැකි සාධක හමුවේ (මෙම මානවයින් විසින් පරිසරයේ දී දකින ලද සතුන් තම වාසස්ථානය වූ ගල් ගුහාවට නැවත පැමිණි පසු, සතුන්ගේ ලේ, ජීවත්වන පරිසරයෙන් ලබාගන්නා ලද විවිධ අමුද්‍රව්‍යවලින් සාදාගන්නා ලද වර්ණ, තිරුවාණා සහ කොරම්ඩම් වැනි දෑ මෙම චිත්‍ර ගුහා බිත්තිවල ඇඳීමට සහ සටහන් කිරීමට යොදාගෙන ඇත). නැගෙනහිර පළාතේ මොනරාගල සිට සියඹලාන්ඩුව දෙසට ගමන් කරන විට හමුවන 39 වන සැතපුම් කනුවේ සිට සැතපුමක් පමණ ගියතැන පිහිටි ගල් ගුහාවක් තුළද, උතුරු මැද පළාතේ අනුරාධපුරයේ සිට වයඹ දිග දෙසට සැතපුම් 25ක් පමණ ගිය පසු හමුවන තන්තිරිමලේ ප්‍රදේශයේ ඇති බිල්ලව ගුහාව එම ගුහාවේ සිට උතුරු දෙසට සැතපුම් තුනක් පමණ ගිය තැන හමුවන කෝමාරිකා ගුහාව තුළින්ද, නැගෙනහිර පළාතේ බාගුරේ පිහිටි කිරි පොකුණ ගලේද, කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි දොරවක කන්ද ලෙන (අදින් වසර 7300 ට පෙර) තුළින් ද අලි ඇතුන්ගේ අඳින ලද (Paintings) සහ ගලෙහි කොටන ලද (Engravings) රූප හමු වී ඇත (රූපසටහන 2). මෙම නිර්මාණ අතරින් ඇතැම් නිර්මාණ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයින් විසින් සිදුකරනු ලැබූ බවට විශ්වාස කල හැකි අතර අනෙකුත් නිර්මාණ මෑත ඉතිහාස කාලවලදී (Neolithic period) සිදු කරන ලද ඒවා විය හැකිය (පී.ඊ.පී. දැරණියගල).

ප්ලයිස්ටොසීනයේ දී ශ්‍රී ලංකාවේ ජීවත්ව සිට වඳවී ගිය අලි විශේෂ තුනකට අයත් ෆොසිල රත්නපුර ෆොසිල තැන්පතු තුළ තිබී හමු වී ඇත. එනම්

01. ***Palaeoloxodon Namadicus*** **-** *Elephas Namadicus* (Palaeoloxodon namadicus sunhaleyus), Deraniyagala 1944 (type in British Museum) (රූපසටහන - 3)

02. ***Elephas Hysudricus*** (Hypselephas hysudricus sinhaleyus), Deraniyagala 1944. (type loc. Kuruvita, typy in Colombo museum, paratype in British Museum) (රූපසටහන - 4)

03. ***Elephas Maximus Sinhaleyus***, Deraniyagala 1939. (type loc. Kuruvita, co- types in British Museum) (රූපසටහන - 5)

යන විශේෂ තුනයි.

මේ අතරින් *Elephas Hysudricus* සහ *Elephas Namadicus* යන අලි විශේෂ (Species) වර්තමාන ආසියානු අලින්ගේ උප විශේෂ (Sub Species) වලින් සහ ශ්‍රී ලංකාවේ සිටින උප විශේෂයෙන් මෙන්ම එම අලියාගේ පූර්වජයා වන වඳවීගිය *Elephas Maximus Sinhaleyus* උප විශේෂයෙන් වෙනස් වූ අලි විශේෂ වන අතර ආසියාව පුරා විහිදී ඇති ප්ලයිස්ටොසීනයට අයත් ෆොසිල තැන්පතු තුළින් ද මෙම සතුන්ට අයත් ෆොසිල හමුවේ. *Elephas Maximus Sinhaleyus* වන වර්තමාන ශ්‍රී ලංකානු අලියාගේ පූර්වජයා වඳවී යාමට ප්‍රථම ඉතිහාස කාලයේ දී මෙම හස්තීන් දෙදෙනාම ආසියානු කලාපය තුළින් වඳ වී ගොස් ඇත. ප්ලයිස්ටොසීනයේදී ඇති වූ දේශගුණික වෙනස්වීම් මෙම අලි ඇතුන් වඳවීමට ප්‍රධාන වශයෙන්ම හේතුවන්නට ඇතැයි සිතිය හැකිය. මෙම අලි විශේෂ දෙකෙහිම හිසෙහි නළල ප්‍රදේශයේ කපාලයෙහි අස්ථික නෙරීමක් (Bony "Calval" crest) පිහිටා ඇත. *Palaeoloxodon Namadicus* (රූපසටහන - 6) ගේ එම නෙරීම ඇහි බැම මට්ටමේ පිහිටන අතර *Elephas Hysudricus* (රූපසටහන - 7) ගේ හිසෙහි නළල ප්‍රදේශයේ මුදුනට වන්නට පිහිටයි. වර්තමාන ආසියානු අලියාට වඩා වැඩි විශාලත්වයෙන් යුතු මෙම *Elephas Hysudricus* සහ *Elephas Namadicus* ගේ උරහිසට ඇති උස අඩි 11 ඉක්මවයි. මේ අතරින් *Elephas Namadicus* ගේ හමුවන ෆොසිල සාධක අනුව එම හස්තියා *Elephas Hysudricus* ට වඩා වැඩි ප්‍රදේශයක ආසියානු කලාපය පුරා ව්‍යාප්තව සිට ඇත. එම ෆොසිල ඉන්දියාව, බුරුමය, චීනය සහ ජපානයේ ඇතැම් ප්‍රදේශවලින්ද හමු වී ඇත. මොවුන්ගේ පාෂාණීභූත වූ සම්පූර්ණ හිස්කබල්, දත්, සහ අස්ථි කොටස් එම ෆොසිල තැන්පතු තුළින් හමු වුවද මෙම හස්තීන් විශේෂ දෙකට අයත් ෆොසිල වූ දත්වල කොටස් (Molars) පමණක් ඉතා සීමිත ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ රත්නපුර ප්‍රදේශය (කුරුවිට, පැල්මඩුල්ල, නාගොඩ) මූලික කරගත් රත්නපුර සත්ත්ව සන්නතිය (Rathnapura Fauna) නැතහොත් ප්ලයිස්ටොසීනයට අයත් ෆොසිල තැන්පතු තුළින් හමු වී ඇත. ෆොසිලකරණය වූ සම්පූර්ණ හිස්කබල් හෝ අස්ථි කොටස් හෝ සම්පූර්ණ අස්ථි පද්ධති මෙතෙක් ශ්‍රී ලංකාවෙන් හමු වී නොමැත. එම ෆොසිල හමුවන්නේ ද *Elephas Maximus Sinhaleyus* ගේ ප්ලයිස්ටොසීනයට අයත් ෆොසිල හමුවන දියලු (Alluvial) තැන්පතු තුළින්ම වීම ද

විශේෂත්වයකි. මෙම වඳවී ගිය හස්තීන් තිදෙනාගේම ෆොසිල එකම තැන්පතුවක් තුළින් හමුවන්නේ නැවත තැන්පත් වීමක් (Redeposition) නිසා බව පී.ඊ.පී. දැරණියගල මහතා සඳහන් කරයි. වසර ගණනාවක සිට මෙම ෆොසිල පිළිබඳව සිදුකරන ලද වැඩිදුර පර්යේෂණ සහ අධ්‍යයනයන්ට අනුව සත්ත්ව පුරාවිද්‍යාඥ කැලුම් නලින්ද මනමේන්ද්‍රආරච්චි මහතාගේ අදහස වන්නේ ශ්‍රී ලංකාවෙන් හමු වී ඇති *Elephas Hysudricus* සහ *Elephas Namadicus* යන වඳවී ගිය හස්තීන්ට අයත් යැයි සැලකෙන ෆොසිල වූ දත් කොටස් වර්තමාන අලියාගේ පූර්වජයා වන *Elephas Maximus Sinhaleyus* ගේම බව පෙනී යන බවයි. නමුත් තවදුරටත් ඉතා සියුම්ව සිදුකරනු ලබන විද්‍යාත්මක පර්යේෂණ සහ අධ්‍යයනයන් තුළින් එම ෆොසිල පිළිබඳව නිගමනය කිරීම වඩා සුදුසු බව ඒ මහතා පෙන්වා දෙයි.

*Elephas Maximus Sinhaleyus* වර්තමාන ශ්‍රී ලංකා අලියාගේ (*Elephas Maximus Maximus*) පූර්වජයා ලෙස සැලකෙන අතර ප්ලයිස්ටොසීනයේ දී ශ්‍රී ලංකාවේ ජීවත්ව සිට වඳවී ගිය අලි ඇතුන් විශේෂ අතරින් එම යුගයට අයත් ෆොසිල තැන්පතු තුළින් වැඩිපුරම හමුවන්නේ මෙම සත්ත්වයාගේ ෆොසිල වේ. ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථාන කැනීම්වලින් ද මෙම හස්තියාට අයත් ෆොසිල ඉතා සුළු ප්‍රමාණයක් හමු වී ඇත. ප්‍රමාණයෙන් වර්තමාන අලියාට වඩා කුඩා මෙම හස්තියා පරිනාමිකවම අර්ධ ජලීය සත්ත්වයකු වන නිසා ප්‍රධාන වශයෙන්ම තෙත් කළාපය පුරා පැතිරී සිටින්නට ඇති බව හමු වී ඇති ෆොසිල සාධක අනුව පෙනීයයි. මොවුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් විසින් දළ (Tusk) දරා ඇත. ප්ලයිස්ටොනයේ දී හිපපොටේමස් (*Hexaprotodone sinhaleyus*) සතුන් පවා ජීවත් වූ වගුරු බිමක්ව පැවති රත්නපුර ආශ්‍රිත ප්‍රදේශ මෙම අලි ඇතුන්ට ජීවත්වීමට මනා පරිසර තත්ත්වයන් තිබෙන්නට ඇත. ප්ලයිස්ටොසීනයේ දී සිදුවූ දේශගුණික විපර්යාසයන් නිසා ඇති වූ ඉතා දැඩි වියළි දේශගුණික තත්ත්වයන් මෙම හස්තියාගේ වඳවීයාමට හේතු සාධකයක් වීම සිදුවිය හැකි නමුත් ඒ පිළිබඳව වැඩිදුරටත් සොයා බැලීම සඳහා ඉදිරි පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සිදුකළ යුතුව ඇත. යුරෝපා මහාද්වීපයේ ව්‍යාප්තව සිට අවසාන වශයෙන් ලොවෙන් වඳවී ගිය ප්‍රෙබොසිඩියා ගෝත්‍රයේ පුරුක යැයි සැලකෙන මැමත් (*Mammuthus Premigenious*) අලි ඇතුන්ගේ වඳ වීමට ප්ලයිස්ටොසීනයේ දී ඇති වූ දේශගුණික විපර්යාස මෙන්ම යුරෝපයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයින් විසින් Clovis වැනි ඉතා තියුණු ගල් ආයුධ යොදාගනිමින් ඔවුන්ගේ ආහාරය පිණිස එම මැමත් සතුන් දඩයම් කිරීම ද හේතුවූ බවට ෆොසිල සාධක සහ එම සතුන්ගේ ෆොසිල සමඟ හමු වී ඇති Clovis ආයුධ පදනම් කරගෙන කරුණු ඉදිරිපත් වී ඇත. නමුත් ශ්‍රී ලංකාවේ ප්ලයිස්ටොසීනයට අයත් දියලු තැන්පතු තුළින් සහ ප්‍රාග් ඓතිහාසික මානවයින් ජීවත් වූ වාසස්ථාන තුළින් මෙම හස්තීන්ට අයත් ෆොසිල හමු වුවද ඔවුන්ගේ ආහාරය පිණිස එම අලි ඇතුන් දඩයම් කලාය යන්න සාධක මෙතෙක් හමු වී නොමැත. ශ්‍රී ලංකාවේ දැනට ඉතිරිව ඇති පහතරට නිවර්තන වැසි වනාන්තරවලින් එකක් වන විශාලත්වයෙන් සිංහරාජයට පමණක් දෙවෙනි වන මොරපිටිය - රුහුණ කන්ද (රූණ කන්ද - හෙක්ටයාර් 5500-6000, දකුණු පළාත, සබරගමු පළාත, බස්නාහිර පළාත යන පළාත් තුනට මායිම්ව පිහිටා ඇත) වනාන්තරය ආශ්‍රිතව අප විසින් සිදුකරන ලද ගවේශණයකින් හෙළි වූයේ 1940 ගණන්වල (දෙවන ලෝක යුධ සමය) දී එම ප්‍රදේශයේ ව්‍යාප්තව සිටි අලි ඇතුන්ගෙන් කිහිපදෙනෙකු ගම් වැදුනු අවස්ථාවක එහි සිටි ඇතින්නක සහ පැටවකු වීරසිංහ කන්ද නම්

ප්‍රදේශයෙදී වෙඩි තබා ඝාතනය කොට එම අලින්ගේ මස් වීරසිංහ නම් පෙළපත් නාමයකින් පැවත එන පරම්පරාවක සිටි පිරිසක් විසින් ආහාරයට ගත් බවත් එසේ මරා දමන ලද අලියකුගේ වියළා සකස් කරන ලද කකුලක් වර්තමානය වන විටත් එම පරම්පරාවෙන් පැවත එන පිරිසක් සතුව පවතින බවයි. එම කකුල් කොටස නිරීක්‍ෂණය කිරීමට අවස්ථාවක් ලබාගැනීමට කිහිපවරක්ම උත්සාහ කලද ඒ සඳහා තවමත් අවස්ථාවක් ඔවුන් විසින් ලබා නොදුනනේ මරා දමන ලද අලියකුගේ කුමන හෝ කොටස් ලඟ තබා ගැනීම නීතියට පටහැනි කරුණක් වන නිසා වන්නට පුළුවන. 1940 පමණ කාලවකවානුව වන විට ප්‍රධාන වශයෙන්ම කෘෂි කාර්මික දිවි පෙවෙතකට හුරුව සිටි එම ප්‍රදේශයේ ජීවත් වූ මිනිසුන් අතීතයේ දී මෙන්ම දඩයමින් ද ආහාර අවශ්‍යතාවයන් සපුරා ගන්නට ඇත. නමුත් අලියෙකු මරා ආහාර අවශ්‍යතාවයන් සපුරා ගන්නට තරම් හේතු වූ කාරණා මොනවාද යන්න විමසා බැලිය යුතුය. එම කාලවකවානුව වන විට දෙවන ලෝක යුධ සමය පැවති නිසා ජපානය විසින් බොම්බ හෙලනු ලබයි යන බියෙන් දකුණු (රුහුණු) ප්‍රදේශයේ සිට පැමිණි පිරිස් ආරක්‍ෂාව පතා මෙම වනාන්තරයේ අට්ටාල සාදාගෙන සැඟවී සිට ඇත. (රුහුණෙන් පැමිණි මිනිසුන් ජීවත් වූ කන්ද පසුව රුහුණ කන්ද නම් විය). එම සැඟවී සිටි පිරිස්වලින් පැවත එන පරම්පරා අදටත් රුණ කන්ද ආශ්‍රිත ගම්මානවල ජීවත් වේ. එම දෙවන ලෝක යුධ කාල වකවානුවේදී ඔවුන් හට මුහුණ දෙන්නට සිදුවූ ආහාර හිඟයක් මෙම අලින් මරා මස් කන්නට හේතු වූවාද යන්න වැඩිදුරටත් සොයා බැලිය යුතු කාරණයකි. කුමන කරුණක් නිසා හෝ සම්පූර්ණයෙන්ම කෘෂි කර්මාන්තය මගින් ආහාර සපයාගත් 1940 පමණ මෑත කාලයේ දී පවා අලින් මරා ආහාරයට ගත්තේ නම් මූලික වශයෙන්ම දඩයමින් තම ආහාර අවශ්‍යතාවයන් සපුරාගත් ප්‍රාග් ඓතිහාසික මානවයන් විසින් ද ඔවුන්ගේ ආහාර අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා මෙම අලි ඇතුන් මරා මස් ආහාරයට ගන්නට ඇතැයි යන්න උපකල්පනය කළ හැකිය.

ප්ලයිස්ටොසීනයේ දී රත්නපුර ආශ්‍රිත වගුරු බිමක සිතුවම් කරන ලද දර්ශනයක් (රූපසටහන 1).





ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයින් විසින් අඳින ලද අලි ඇතුන්ගේ ගුහා චිත්‍ර (රූපසටහන 2)



1. ***Palaeoloxodon Namadicus - Elephas Namadicus*** (*Palaeoloxodon namadicus sunhaleyus*) චාර්වක දතක් (Molar) (රූපසටහන 3)



2. ***Elephas Hysudricus*** (*Hypselephas hysudricus sinhaleyus*) චාර්වක දතක් (Molar) (රූපසටහන 4)



3. ***Elephas Maximus Sinhaleyus***, චාර්වක දතක් (Molar) (රූපසටහන 5)



***Palaeoloxodon Namadicus*** (*Palaeoloxodon namadicus sunhaleyus*) සිතුවමක්



***Elephas Hysudricus*** (*Hypselephas hysudricus sinhaleyus*) සිතුවමක්

## References


Deraniyagala, P.E.P. 1955. Some Extinct Elephants, Their Relatives and the Two Living Species. Ceylon National Museum Administration, Colombo.

Deraniyagala, P.E.P. 1958. The Pliestocene of Ceylon. Ceylon National Museum Publication, Colombo